25.07.2016

Learning Resource Center

# මීගමුව අධ්‍යාපන කලාපය
# දෙවන වාර ඇගයීම - 2016
# පෙරදිග සංගීතය

විභාග අංකය: ..............................

කාලය පැය 03 යි.

| 10 ශ්‍රේණිය | I කොටස |
|---|---|

සැලකිය යුතුයි:-

- සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 දක්වා ප්‍රශ්නවල, දී ඇති 1, 2, 3, 4 යන පිළිතුරුවලින් වඩාත් ගැළපෙන හෝ නිවැරදි පිළිතුර තෝරන්න.
- I ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40ක් පිරිනැමේ.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

01. රි ප ම ප, ම ගු රි ස, රි නි ධ නි, ප ධ ම ප, ම ගු රි ස මෙම ස්වර ඛණ්ඩය අයත් නිර්දේශිත රාගය වනුයේ,
 (1) කාෆි රාගය ය. (2) භෛරවී රාගය ය.
 (3) යමන් රාගය ය. (4) භූපාලි රාගය ය.

02. රි ග ධ නි ම් යන ස්වර පහම විවාදී ස්වර වශයෙන් යොද ගත හැකි රාගය කුමක් ද?
 (1) යමන් රාගය (2) බිලාවල් රාගය
 (3) කාෆි රාගය (4) භෛරවී රාගය

03. ස්වර සප්තකයේ ඇතුළත් වනුයේ,
 (1) චල ස්වර 2ක් සහ අචල ස්වර 5 කි. (2) අචල ස්වර 2 ක් සහ චල ස්වර 5 කි.
 (3) චල ස්වර 4 ක් සහ අචල ස්වර 3 කි. (4) අචල ස්වර 3 ක් සහ චල ස්වර 4 කි.

04. ඖඩව ෂාඩව ජාති රාගයක ආරෝහණ අවරෝහණ ස්වර සංඛ්‍යාව දැක්වෙනුයේ මෙසේ ය.
 (1) 5 - 6 (2) 5 - 7
 (3) 6 - 5 (4) 6 -7

05. සර්ගමයක අඩංගු විය යුතු අත්‍යාවශ්‍ය ම අංගය වනුයේ,
 (1) තානාලංකාරයි. (2) පදමාලාවයි.
 (3) ස්වරයි. (4) රිද්මයයි.

06. රාග විස්තර දැනගැනීමට මහෝපකාරී වනුයේ මින් කුමක් ද?
 (1) සර්ගම් ගී (3) මධ්‍යාලය ගී
 (3) ලක්ෂණ ගී (4) තානාලංකාර

07. "ම" ස්වරය වර්ජිත වන්නේ,
 (1) යමන් රාගයේ ය. (2) බිලාවල් රාගයේ ය.
 (3) භූපාලි රාගයේ ය. (4) භෛරවී රාගයේ ය.

08. තීව්‍ර මධ්‍යමය, මන්ද්‍ර කෝමල නිශාධය, උච්ච කෝමල රිෂභය, උච්ච තීව්‍ර මධ්‍යමය යන ස්වර නාමවලට අදාළ සංකේත පිළිවෙළින් මෙසේ ය.

(1) ම් රි ග ම (2) ම් රි ම් නි

(3) ම් නි රි ම් (4) ම් නි රි ම

09. භූපාලි රාගයේ ස්වර පදනම් කොට ගත් තනු ඛණ්ඩයක් වනුයේ,

(1) ස ග ම | ප ග ම | නි ධ ප | ධ ග ම

(2) ග ග ප | ධ සං - | සං රි සං | සං ධ ප

(3) නි ධ ප | ම ග රි | ස රි ග | ම ප -

(4) ග ප ධ | නි සං නි | ධ ප ධ | ප ග -

10. ගායනා යන්ත්‍ර, කථා කරන මැෂිම, කතාවාහිනී යන අන්වර්ථ නාමයන්ගෙන් හැඳින්වූයේ කුමක් ද?

((1) ග්‍රැමෆෝනය (2) ගුවන් විදුලිය

(3) රූපවාහිනිය (4) මයික්‍රෝෆෝනය

11. මෙරට ගුවන් විදුලි සරල ගී ආරම්භයේ දයකත්වය ලබා දුන් ප්‍රකට සංගීතඥයින් දෙපළකි.

(1) ජී. ආර්. එඩ්වඩ් මහතා සහ ආර්. ඒ. චන්ද්‍රසේන මහතා

(2) ආනන්ද සමරකෝන් ශූරීන් සහ සුනිල් සාන්ත ශූරීන්

(3) නන්ද මාලනී මහත්මිය සහ අමරදේව ශූරීන්

(4) එච්. ආර්. ජෝතිපාල මහතා සහ ලයනල් අල්ගම ශූරීන්

12. මෙරට ග්‍රැමෆෝනයේ තැටිගත කළ ප්‍රථම සිංහල ගීත තැටියට ඇතුළත් වූයේ,

(1) ප්‍රේම ගීත (2) බටහිර ගීත

(3) නූර්ති ගීත (4) හින්දි ගීත

13. ග්‍රැමෆෝන් යුගයේ තැටිගත වූ ස්වාධීන ගීතවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් **නොවන්නේ,**

(1) හෙළ බස යොදා ගෙන ගීත නිර්මාණය වීම.

(2) වංග හා ජන නාද රටාවල තනු සහිත ගීත නිර්මාණය වීම.

(3) ප්‍රේමය, ස්වභාව සෞන්දර්ය, ආගම භක්තිය දනවන ගීත බිහිවීම.

(4) හාමනි, කවුන්ටර් පාට් වැනි ශිල්පීය අංග යොදා ගීත නිර්මාණය වී තිබීම.

14. කපිරිඤ්ඤා ගීත ගායනයේ දී ඒ හා බද්ධ වූ නැටුම් විශේෂය නම්,

(1) බයිලා නැටුම් ය. (2) වෙස් නැටුම් ය.

(3) කාවඩි නැටුම් ය. (4) ගැමි නැටුම් ය.

15. කපිරිඤ්ඤා ගීත ආභාසයෙන් නිර්මාණය වූ සරල ගීතයක් වන්නේ කුමක් ද?

(1) කළිඳු ගංගා ඉඹිණියේ (2) රස ආහර කවලා

(3) සාදු දන්තදා (4) ඉඳුනිල් මිණිකැට පරදවන

16. "මල් මිහිර", "ගුවන් තොටිල්ල" "ගංගා ගීතය" මෙම ගී පොත් ලියා ඇත්තේ,

(1) ආනන්ද සමරකෝන් ශූරීන් ය. (2) සුනිල් ශාන්ත ශූරීන් ය.

(3) ෂෙල්ටන් ප්‍රේමරත්න ශූරීන් ය. (4) එදිරිවීර සරච්චන්ද්‍ර ශූරීන් ය.

17. ශ්‍රී ලංකාවේ සේ ගී තුළ දක්නට ලැබෙන විශේෂත්වයකි.

(1) සරල බස් වහර (2) තනුවේ ඒකාකාරී බව

(3) පටු ස්වර ක්ෂේත්‍රයක් තිබීම. (4) සංකීර්ණ බස් වහර

18. සංගීතයේ ස්වර දෙළොස ශුද්ධ, කෝමළ, තීව්‍ර වශයෙන් වර්ග කළ විට ලැබෙන සංඛ්‍යා පිළිවෙළින් මෙසේ ය

(1) 5 - 5 -2 (2) 4 - 6 - 2 (3) 6 - 5 - 1 (4) 7 - 4 - 1

19. "මව්පියො ආදී සොඳුරු තමාගේ" "බැස සීතල ගඟුලේ" "හරිමි රජ සැපා" "සිරි බුද්ධ ගයා විහාරේ" යන ගී හතරම නම් කළ හැකි වනුයේ,

(1) නූර්ති ගී වශයෙනි. (2) ග්‍රැමෆෝන් ගී වශයෙනි.

(3) චිත්‍රපට ගී වශයෙනි. (4) නව නාට්‍ය ගී වශයෙනි.

20. ස්වර සප්තකය තුළ අර්ධ පරතරයක් ඇත්තේ,

(1) ස - රි ස්වර අතර ය. (2) රි - ග ස්වර අතර ය.

(3) ග - ම ස්වර අතර ය. (4) ම - ප ස්වර අතර ය.

- පහත සඳහන් ගීත ප්‍රස්තාරය සම්බන්ධ කර ගනිමින් 21 - 24 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| ස ස රි රි | ග - ම - | ස රි ග ම | ප ධ ප - |
| ප ධ ම ප | ග ම රි ග | ස රි ග ම | ග රි ස - |
| ස රි ග ම | රි ග ම ප | ග ම ප ධ | නි නි ස̇ - |
| ස̇ නි ධ ප | නි ධ ප ම | ධ ප ම ග | රි රි ස̇ . |

21. ඉහත ප්‍රස්තාරයට අදළ ගීතයේ මුල් ගී පාදය වනුයේ,

(1) සමනල පෙරහැර මුණි සිරි පාදේ (2) මුණි සිරි පාදේ සමනල මුදුනේ

(3) වඩිනට යනවලු හිමගිරි අතරේ (4) හද සිසිලස දෙන බුදු ගුණ පැතිරේ

22. එම ගීතය නිර්මාණය වී ඇත්තේ කුමන තාලය මත ද?

(1) ජප් තාලය මත ය. (2) දීප්චන්දි තාලය මත ය.

(3) කෙහෙර්වා තාලය මත ය. (4) ධාදරා තාලය මත ය.

23. මෙම ගීතයේ ස්වර පරාසය වනුයේ,

(1) ස - ග දක්වා ය. (2) ග - ප දක්වා ය. (3) ස - ස̇ දක්වා ය. (4) ස - ධ දක්වා ය.

24. ඉහත සඳහන් ප්‍රස්තාරයේ තුන්වන පේළියේ මුල් විභාග දෙකට අයත් ගීත ඛණ්ඩ මෙසේ ය.

(1) හද සිසිලස දෙන (2) මුණි සිරිපාදේ (3) සමනල පෙරහැර (4) වඩිනට යනවලු

25. ගාන්ධාරය සහ නිශාධය කෝමළවන ගී පාදයකි.

(1) කඳුපෙළ අතරේ (2) කඳු කඳු නැගෙනා (3) ඇත ඇදි යලි (4) පොතපත කියවා

- පහත දැක්වෙන ගී පාද අතුරෙන් අංක 26 - 29 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ ජන ගීවලට අයත් ගී පාද කිහිපයක් පහත දැක්වේ.

A - දෙඩම් කපාලා ඇඹුල් කනාලා

B - සීත ගඟුළෙ දී ඇඳ පේ වෙනවා

C - දුප්පත් කමට ගොන් බැඳගෙන දක්කනවා

D - දඩිබිඩි ගගා කරනා වැඩ රට වටියේ

E - මලේ මලේ අර නාමල නෙලා වරෙන්

26. ඉහත ගී පාද සියල්ලට ම අදාළව සත්‍යවන ප්‍රකාශය කුමක් ද?

(1) A ඛණ්ඩයට අයත් ගීතය ගොයම හා සම්බන්ධය.

(2) B සහ D ගීත පාරු පැදීම හා සම්බන්ධය.

(3) E නෙළුම් ගී හා සම්බන්ධය

(4) ගීත සියල්ල ම ගැමි ගී හා සම්බන්ධය.

27. ඉහත ගී පාද අතුරෙන් ආඝාතාත්මක ගීත දෙක වනුයේ,

(1) A B ය. (2) C D ය. (3) D E ය. (4) B E ය.

28. ගැමි ක්‍රීඩා හා බැඳි ගී පාදය වනුයේ,

(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

29. මෙහෙ ගී පාද ලෙස සැලකිය හැක්කේ,

(1) BCD ය. (2) ABC ය. (3) CDE ය. (4) DEB ය.

30. මනමත් කරවන දන මුළු දෙරණා මෙම පැදි පාදය,

(1) සූවිසි මත් පැදියකි. (2) දෙළොස්මත් පැදියකි.

(3) සොළොස්මත් පැදියකි. (4) විසිමත් පැදියකි.

31. ඉහත පැදිය ඇතුළත් වනුයේ,

(1) ගුත්තිල කාව්‍යයේ ය. (2) සැළලිහිණි සංදේශයේ ය.

(3) මයූර සංදේශයේ ය. (4) මනමේ නාට්‍යයේ ය.

32. "ආලෙ බැන්ද මාගෙ රම්‍ය වන්, වගුරට නරනිඳු, ප්‍රේමයෙන් මන රංජිත වේ". මෙම ගී පාද පිළිවෙළින් අයත්වන නාට්‍ය වනුයේ,

(1) මනමේ, සිංහබාහු, කාලගෝල (2) කාලගෝල, සිංහබාහු, මනමේ

(3) සිංහබාහු, මනමේ, කාලගෝල (4) කාලගෝල, මනමේ, සිංහබාහු

33. බායාවේ "ගෙ" අක්ෂරයත්, දයාවේ "තිං" අක්ෂරයත් යන දෙක එකවර වැයීමෙන් උපදින අක්ෂරය වනුයේ,

(1) ධා (2) ධිං (3) තිං (4) ට

34. $\frac{3}{4}$ $\frac{4}{4}$ $\frac{5}{8}$ ආදී වශයෙන් දැක්වෙන්නේ බටහිර සංගීතයේ තාලය පෙන්වන සංකේතයන් ය. මේ අතරින් $\frac{5}{8}$ ට අනුරූප හින්දුස්ථානි තාලය වන්නේ,

(1) ධාධරා තාලයයි. (2) ත්‍රිතාලයයි. (3) ජප් තාලයයි. (4) කෙහෙර්වා තාලයයි.

35. ගී පාද දෙකක් අතර යෙදෙන ඉතා කෙටි සංගීත ඛණ්ඩ හඳුන්වන්නේ කෙසේ ද?

(1) Chords (2) Counter Points (3) Bits (4) Chorus

36. බොක්ස් ගිටාරයකින් සරල ගීතයක් සඳහා වාදනය කිරීමට සුදුසුම අංගය කුමක් ද?

(1) Chorus (2) Bits (3) Counter Points (4) Chords

37. බටහිර සංගීතයේ සමඝාත භාණ්ඩවලට අයත් භාණ්ඩ යුගලයක් වනුයේ,

(1) සයිලෆෝනය සහ මෙලෝඩිකාව ය. (2) සයිලෆෝනය සහ ග්ලොකන්ස්පීලය ය.

(3) ජල තරංග සහ සැක්සෆෝනය ය. (4) ග්ලොකන්ස්පීලය සහ බට නලාව ය.

38. ජප් තාලයට අනුරූප බෙර පදයක් වනුයේ,

(1) ගුම්ද | දෙගත | ගතිග | තගුඳ (2) දෙං | ජිංත | ගත | දෙංත

(3) ජිං | ජිමිකිට | තත් | කිටිතක (4) දෙං | දෙංජිං | ජිං | ගජිගත

39. බලිවාලා නාට්‍ය කණ්ඩායම පැමිණීමෙන් පසු ශ්‍රී ලංකාවේ ව්‍යාප්ත වූයේ,

(1) නූර්ති රංග ශෛලියයි. (2) නාඩගම් රංග ශෛලියයි.

(3) සොකරි රංග ශෛලියයි. (4) කෝලම් රංග ශෛලියයි.

40. සංගීතයේ නව ප්‍රවණතා ක්ෂණයකින් අපට ලබා ගත හැකි වනුයේ,

(1) පරිගණකය හරහා ය. (2) අන්තර්ජාලය හරහා ය.

(3) විශ්ව විද්‍යාල හරහා ය. (4) ග්‍රැමෆෝනය හරහා ය.

25.07.2016

මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම - 2016

# පෙරදිග සංගීතය

විභාග අංකය: ....................................................

| 10 ශ්‍රේණිය | II කොටස |
|---|---|

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) බිලාවල් රාගයේ වාදී, සංවාදී ස්වර ලියන්න.

(ii) සිතාරයේ ප්‍රධාන තත සුසර කරන්නේ කිනම් ස්වරයට ද?

(iii) ත්‍රිරිස, ත්‍රිරිගරිස, ................. යමන් රාගයට අනුව ඊළඟ ස්වර අභ්‍යාස ඛණ්ඩය කුමක් ද?

(iv) තත්, සුෂිර, ඝණ, අවනද්ධ යන භාණ්ඩ වර්ග හතරට අයත් භාණ්ඩ 4 ක් පිළිවෙළින් නම් කරන්න.

(v) නූර්ති සඳහා යොදා ගත හැකි සංගීත භාණ්ඩ යුගලයක් දක්වන්න.

(vi) තබ්ලාවේ කොටස් 2 නම් කරන්න.

(vii) දෙළොස්මත් පැදියකට උදාහරණයක් දෙන්න.

(viii) ස රි ග ප ධ සෘ මෙම ආරෝහණය අයත් රාගය කුමක් ද?

(ix) නිර්දේශිත රාග අතුරෙන් ................ රාගය ඖඩව ජාතිවන අතර ............... රාගය සම්පූර්ණ ජාති වේ.

(x) ජන ගී වර්ගීකරණයට අනුව මෙහෙ ගී ................ වර්ගයට ද ප්‍රශස්ති, වන්නම් ආදිය ......... වර්ගයට ද අයත් වේ.

(ලකුණු 1×12= 12)

02. නිර්දේශිත රාග දෙකකට අයත් ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- දිවා ප්‍රථම ප්‍රහරයේ ගැයේ වැයේ.
- සියලු ම කෝමල ස්වර ඇසුරු කරයි.
- රාත්‍රී ප්‍රථම ප්‍රහරයේ ගැයේ වැයේ.
- තීව්‍ර මධ්‍යමය යොදා ගැනේ.
- එන්න මදනලේ, කවාලා විළඳ ජාති, වැනි ගී තනු මෙම රාගය ආශ්‍රිතව නිර්මාණය වී ඇත.
- සාධු දන්ත ද, අඳුර අඳුර මගේ වැනි ප්‍රචලිත ගීත මෙම රාගය ඇසුර ලබා නිර්මාණය වී ඇත.

(i) ඉහත ලක්ෂණවලට අදාළ රාග දෙක නම් කරන්න.

(ii) එම රාග දෙකට අනුව ඒවා වගු ගත කරන්න.

(iii) ඉන් එකකට අයත් මධ්‍යලය ගීයක ස්ථායි කොටසේ ගීත ස්වර ප්‍රස්තාරය තානාලංකාර 2 ක් සමගින් ලියා දක්වන්න.

(ලකුණු 2+6+4 = 12)

03. පහත සඳහන් ස්වර පාද හතරෙන් ප්‍රකාශවන රාග හඳුනාගන්න.

(අ) ග ප ධ නි | ස̇ - ධ ප | ම ග ම රි | ස රි ස -

(ආ) ස රි ග රි | ස රි ස ධ̣ | - ස - රි | ග - - -

(ඉ) ස රි ග ම | - ග - රි | ස - ධ̣ නි̣ | ස - - -

(උ) නි ධ - ප | ම් ප ග ම් | ප - - - | ප ම් ග රි

(i) ඉහත රාග 4 නම් කර, ඊට අනුරූපව ආරෝහණ, අවරෝහණ ස්වර හා රාග ජාති පිළිවෙළින් ලියන්න.

(ii) "ලක්‍ෂණ" ගීත යන්න කෙටියෙන් හඳුන්වන්න.

(iii) ලක්‍ෂණ ගීතයක ස්ථායි කොටස, නියමිත තාල සංඥා සහිතව, ගීත ස්වර ප්‍රස්තාරගත කරන්න.

(ලකුණු 6+2+4= 12)

04. (i) මාත්‍රා 10ක් හා මාත්‍රා 16ක් යෙදෙන තාල දෙක නම් කර, එම තාල ප්‍රස්තාර කරන්න.

(ii) ඉන් එක් තාලයකට අදළ ගී පාදයක පද ප්‍රස්තාර කරන්න. (තාලය නම් කිරීම අවශ්‍ය වේ)

(iii) අනෙක් තාලයට අදළ වන සේ රිද්ම රටාවක් හෝ ස්වර අභ්‍යාසයක් ආරෝහණ සහ අවරෝහණ වශයෙන් ගොඩනගන්න. (ලකුණු 6+2+4= 12)

05. පහත සඳහන් පාරිභාෂික පද කෙටියෙන් හඳුන්වන්න.

i. තාල ii. මාත්‍රා iii. සම් iv. ඛලි v. අනුතාල vi. ඨේකා vii. මාත්‍රා viii. කායද ix. තිහායි x. විභාග xi. ලය xii. තිත

(ලකුණු = 12)

06. ගැමි ගී හා සෙ ගී වශයෙන් ශ්‍රී ලංකාවේ ජන ගී කොටස් 2 කට බෙද දක්වනු ලැබේ.

(i) පහත සඳහන් ගී පාද ගැමි ගී හා සෙ ගී යන දෙකොටසට වෙන් කර දක්වන්න.

- රූ රැසේ අඳිනා ලෙසේ
- දෙඩම් කපාලා ඇඹුල් තනාලා
- චන්ද නම් යස තේජ කුංකුම
- සඳවා සුදු වැලි පිවිතුරු
- උදේ සිටන් වකුටු කොන්ද
- කළුවන් කළු රුවයි මංගෝ හිනැහෙනවා
- පැහැසරණිය මිණි පැමිණිය
- දූප්පත් කමට ගොන් බැඳගෙන

(ii) ගැමි ගී හා සෙ ගීවලට අදාළ ලක්‍ෂණ 2 බැගින් ලියන්න.

(iii) ඉහත ගීත ලැයිස්තුවේ ඇතුළත් සෙ ගීයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

(ලකුණු 4+4+4= 12)

07. කපිරිඤ්ඤා සංගීතය විදේශ රටකින් පැමිණ ශ්‍රී ලංකාවේ සංගීත පද්ධතියට එකතු වූවකි. ඒ පිළිබඳව පහත සඳහන් ශීර්ෂ ඔස්සේ සාකච්ඡා කරන්න.

(අ) කපිරිඤ්ඤා හා බයිලා යන්න හඳුන්වා එහි ආරම්භය පිළිබඳව කරුණු 3ක් ලියන්න.

(ආ) මෙම ගායන ශෛලිය ප්‍රචලිත වූ ප්‍රදේශ 2ක් නම් කරන්න.

(ඇ) කපිරිඤ්ඤා සංගීතයේ ලක්‍ෂණ පහක් ලියන්න. (ලකුණු 5+2+5= 12)